# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2307/38 - 2022 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනය

2022 ජූලි 22 වැනි දිනැති අංක 2289/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පලකරන ලද නිවේදනය මගින්, සහ එයට වරින් වර කරන ලද සංශෝධන ප්‍රකාරව ගරු ජනාධිපතිතුමා විසින් කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් මා වෙත පවරා ඇති විෂයයන් හා කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සහ ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත් අතරින් පහත උපලේඛනයේ සඳහන් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සහ ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(5) ව්‍යවස්ථාව මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022.11. 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකී උපලේඛනයෙහි දැක්වෙන ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වෙත පවරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද, මේ සම්බන්ධයෙන් මවිසින් 2022 ඔක්තෝබර් මස 11 දිනැති අංක 2301/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

වෛද්‍ය රමේෂ් පතිරණ,
කර්මාන්ත අමාත්‍ය.

2022 නොවැම්බර් මස 17 වැනි දින.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය I

**ගරු චාමර සම්පත් දසනායක, ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟ පෙන්වීම මත ප්‍රාථමික කර්මාන්ත ගොඩ නැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අදාළ වන්නා වූ මඟ පෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව පවරා දී ඇති විෂයයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩ පිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ii තීරුවෙහි සඳහන් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | 1. ලංකා ලේලන්ඩ් ලිමිටඩ්<br>2. ලංකා අශෝක ලේලන්ඩ් ලිමිටඩ්<br>3. සීමාසහිත ජාතික කඩදාසි සමාගම<br>4. සීමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම (KESCO)<br>5. ජාතික ලුණු සමාගම<br>6. සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම<br>7. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව<br>8. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්<br>9. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)<br>10. සීමාසහිත බී සී සී සමාගම<br>11. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය<br>12. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය<br>13. ලංකා පොස්පේට් ලිමිටඩ් | • ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනත (අංක 1993 අංක 50) |

උපලේඛනය II

**ගරු ප්‍රසන්න රණවීර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟ පෙන්වීම මත කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගොඩ නැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අදාල වන්නා වූ ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව පවරන ලද විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය හා ආයෝජන වැඩ පිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ii තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම. | 1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>2. කුඩා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම<br>3. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අධිකාරිය<br>4. දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය<br>5. ජාතික ශිල්ප සභාව<br>6. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව<br>7. ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟලුම් ආයතනය<br>8. ලංකා ටෙක්ස්ටයිල් මිල්ස් එම්පෝරියම් ලිමිටඩ්<br>9. ලංකා සළුසල ලිමිටඩ්<br>10. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය<br>11. ජාතික මෝස්තර මධ්‍යස්ථානය | • ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි පනත (2006 අංක 17)<br>• ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත හා ඇඟළුම් ආයතන පනත (2009 අංක 12)<br>• ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත (1982 අංක 35) |

EOG 11 - 0288

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.